# මනස හා එහි ක්‍රියාකාරීත්වය පිළිබඳ බෞද්ධ මනෝ විද්‍යාත්මක ප්‍රවේශයක්

## කුඹුගොඩආරේ පඤ්ඤාලෝක හිමි

විශ්වයේ පහල වූ සියලු ආගම් දර්ශන අතුරෙන් බුදු සමය මූලිකව ම වෙනස් වන්නේ මනස පිළිබඳව කර ඇති ඉගැන්වීම් හේතුවෙන් බව අවිවාදිත වූවකි. බුදුසමයෙහි මූලික සිද්ධාන්ත වන කර්මය, පුනර්භවය, පටිච්චසමුප්පාදය, චතුරාර්ය සත්‍යය ආදී සියලු ඉගැන්වීම් මනස මූලික කර ගනිමින් සිදුකර ඇත. විශේෂයෙන් බුදු සමය පුද්ගලයා පිළිබඳව කරන විවරණයන් වෙනත් ආගම් දර්ශනයන්ට වඩා වෙනස් වූවකි. ඒ අනුව පුද්ගලයා යනු භෞතික (රූප) මානසික (නාම) එකතුවකි. කය හා සිත පිළිබඳ ගැටලුව දර්ශනය හා සමය ඉතිහාසයේ ද නිරන්තර විවාදයට ලක් වූවකි. ඒ පිළිබඳව මත ඉදිරිපත් කළ පිරිස ප්‍රධාන කොටස් තුනකි.

1. විඤ්ඤාණය පුද්ගල හරය ලෙස දක්වන අය (විඤ්ඤාණ වාදීන්)

2. පුද්ගලයා යනු භෞතික හැසිරීමක් පමණක් බවත් සිත, මනස, විඤාඤාණය යනු කල්පිත ගුඪ පදාර්ථයන් පමණක් වන බවත් පැවසූ අය (භෞතිකවාදීන්)

3. කය හා සිත ඒකාබද්ධ කරන පදාර්ථයන් ඇති අතර එය අධ්‍යාත්මය නම්. පුද්ගලයා මළ පසු වර්තමාන භවය හා පුනර්භවය සම්බන්ධ කරනු ලබන්නේත්, දෙවියන් වහන්සේ සමග ස්වර්ගස්ථ වන්නේත්, එම ආධ්‍යාත්මය බවත් පැවසූ අය (දේවවාදීන්) යනුවෙනි.

බුදුන් වහන්සේ කය හා සිත පිළිබඳ ඉදිරිපත් කර ඇති ඉගැන්වීම් බුදුසමයට ආවේනික මැදුම් පිළිවෙතෙහි පිහිටා ඇත. පුද්ගලයා යනු නාම රූප එකතුවකි. (නාමඤ්ච රූපඤ්ච) එවිට බුදු සමය



විඤ්ඤාණවාදයකට, භෞතිකවාදයකට හෝ දේවවාදයකට නොවැටේ. බුදු සමය අද්වයවාදී යැයි කියනු ලබන්නේ ඒ නිසාය.

කිතු දහමට අනුව සජීවී සත්වයන් මිනිසුන් පමණි. භෞතික අභෞතික සියල්ල දෙවියන් වහන්සේගේ නිර්මාණ වේ. සියලු සත්වයන්ගේ මව ඊවා බව බයිබලය සඳහන් කරයි.[1] නමුත් බුදු සමයට අනුව ගස්, ගල් ආදිය හැරුණු විට ඇසට පෙනෙන නොපෙනන සෑම සත්වයෙකුට ම සංසාරික ක්‍රියාවලිය පොදුය. ධ්‍යාන බලයෙන් ජීවත්වන අරූපකාරි බ්‍රහ්මයන් හැරුණු කොට සෑම සත්වයකු ම නාම රූප දෙකෙහි එකතුවෙන් නිර්මාණය වී තිබේ. සමහර සත්වයන්ට යම් යම් ඉන්ද්‍රිය නොපිහිටයි. නිදසුනක් ලෙස කුඩැල්ලාට ඇස් නැත. නමුත් මනුෂ්‍යයින්ට පොදුවේ ඉන්ද්‍රිය 06 ම පිහිටයි.

ඇස, කන, නාසය, දිව ශරීරය යන ඉන්ද්‍රියයන් පස භෞතිකව ස්පර්ශ කළ හැකිය. නමුත් මනස යන්න ද්‍රව්‍යාත්මකව ග්‍රහණය කළ නොහැකි නිසා එවන්නක් නැතැයි බටහිර විද්‍යාව තුල මෑතක් වන තුරුම පිලිගෙන තිබුණි. නූතනයේ එම අදහස බැහැරව තිබේ. පෙර දිග චින්තනය තුළ (ක්‍රි.පූ. 485) පමණ යුගයේදී පවා සිත පිළිබඳ දරන මතය අනුව විමුක්තියේ ස්වරූපය ද වෙනස් වුණි. බ්‍රාහ්ම සම්ප්‍රදායන් තුළ සිත ආත්ම සංඥාවෙන් ග්‍රහණය කිරීම හා ජෛන දහම තුළ සිත ආත්මය, ශුන්‍යතාවයට හෙවත් හුදෙකලා කිරීම විමුක්තිය ලෙස සැළකේ. බුදු සමය මනෝ යන්න ධම්ම ආරම්මණ ග්‍රහණය කර ගන්නා ඉන්ද්‍රියක් ලෙස විස්තර කොට තිබේ. මනස විග්‍රහ කිරීම සඳහා බුදු සමය වේදනා, සඤ්ඤා, සංඛාර, විඤ්ඤාණ යන වචන සතර උපයෝගී කරගෙන ඇත. එසේම මනෝ විවරණය පුද්ගල චර්යාව විස්තර කරන විශ්ලේෂණ ක්‍රමයක් ලෙසින් සිදු කර ඇත. විවරණයේ අරමුණ මනස නිරෝගී කිරීමයි. මනස පිළිබඳ පාලි සූත්‍ර සාහිත්‍යගත විග්‍රහය තුළ මානසික පැවැත්ම කයෙන් වෙන් වූ ස්වාධීන සාදාකාලික ආත්මීය පදාර්ථයක් ලෙස පිළිගැනීමක් සිදු වී නොමැති අතර ම මානසික ක්‍රියකාරිත්වය කායිකත්වයට ඌනනය කිරීමක් ලෙස ද සිදු වී නොමැත.

## මනසේ විවිධ පැතිකඩ

පාලි සූත්‍රයන් හි මානසික ක්‍රියාකාරීත්වය විවරණය කිරීම සඳහා චිත්ත, මනෝ, විඤ්ඤාණ යන පදත්‍රය බහුල වශයෙන් භාවිත වී ඇති අතර එම පද තුන මගින් අදහස් වන්නේ එකම මානසික ප්‍රවාහයක් බව සූත්‍ර සාහිත්‍යයේ ම දැක්වේ. "යදිංන වුච්චති චිත්තං ඉතිපි මනෝ ඉතිපි විඤ්ඤාණං ඉතිපි"[2] මෙහිදි අප අරමුණු එම පදත්‍රය පිළිබඳ වෙන් වෙන්ම සූත්‍ර සාහිත්‍යගත විවරණයක් සිදු කිරීමයි.

## චිත්ත

මනස පිළිබඳ විග්‍රහයේදී බහුල වශයෙන් භාවිතා වන පදයක් ලෙස චිත්ත යන්න හඳුන්වාදිය හැකිය. මෙ මගින් මනෝ, විඤ්ඤාණ යන දෙපදයෙන් ආවරණය නොවූ මානසික ප්‍රවාහයේ වැඩි ප්‍රමාණයක් ආවරණය කරන බව පෙනේ. මනෝ, විඤ්ඤාණ විග්‍රහ- යන්ට අනුව එමගින් විවිධ මානසික ධර්ම එක් රැස් කෙරේ. එම මානසික ධර්ම රැඳී පවතින ස්ථානය සිත ලෙස හැඳින්විය හැකිය. චිත් ධාතු වෙන් නිපන් චිත්තෙති යන ක්‍රියා පදයෙහි අතීත කෘදන්ත පදය චිත්ත යන්නයි. ඒ අනුව චිත්ත යනු සිතීම යන ක්‍රියාකාරීත්වයේ ප්‍රතිඵල යන්ගෙන් යුත් එනම් ඒවා රැස්කර ගත් මානසික තත්ත්වයක් ලෙස විග්‍රහ කළ හැකිය. ඒ අනුව පුද්ගලයෙක් මෙසේ ගොඩනගාගත් මානසික තත්ත්වය චිත්ත යනුවෙන් සරලව විග්‍රහ කරගත හැකිය. ඛුද්දක නිකායට අයත් ධම්ම පදයේ චිත්ත වග්ගයෙහි සිතෙහි ලක්ෂණ පිළිබඳ විග්‍රහයක් ඇතුළත් වේ.

1. දුරගමන් යන බව (දූරංගමං)
2. තනිව හැසිරෙන (ඒකචරං)
3. ස්වරූපයක් / ශරීරයක් නොමැති (අසරීරං)
4. ශරීරය තුළ වෙසෙන (ගුහාසයං)
5. සෙලවෙන (ඵන්දනං)
6. චපල, අස්ථාවර වූ (චපලං)
7. දියෙන් ගොඩ දැමූ මසකු මෙන් සැලෙන (පරිපන්දති)



8. රැකීමට අපහසු (දුරක්ඛං)
9. අරමුණු ගැනීම වැළැක්විය නොහැකි (දුන්නිවාරයං)
10. දැකීමට අවබෝධයට අපහසු (සුදුද්දසං)
11. කැමති තැනක වැටෙන (යත්ථකාම නිපාතනං)
12. පහසුවෙන් අල්ලා ගැනීමට අපහසු (දුන්නිගහස්ස ලහුනො)[3]

උක්ත විවරණයට අනුව සිතෙහි ඇත්තේ ස්වයංක්‍රීය ක්‍රියාකාරකමකි. එහි අරමුණු නොනැවැත්විය හැකි අතර අරමුණු සඳහා දක්වන ප්‍රතිචාර සීමා කළ හැකිය. නමුත් ධ්‍යාන සමාපත්ති ආදියට අනුගතවීමෙන් අරමුණු ගැනීම පවා පාලනය කළ හැකි බව බුදු දහමයෙන් ප්‍රකට වේ. සිත වැඩීම සඳහා අවශ්‍ය මග පෙන්වීමක් ද මෙහිදී සිදු කර තිබේ. ඒ අනුව සිතෙහි උක්ත ලක්ෂණ සියල්ල පාලනයට ලක් කළ හැකි යෝජනාවක් ද චිත්ත වග්ගයේදී පැහැදිලි කරයි.

1. උජුං කරොති - ඍජු කිරීම.
2. චිත්තස්ස දමතෝ - සිතෙහි දමනය ඇති කිරීම.
3. චිත්තං රක්ඛති - සිත ආරක්ෂා කර ගැනීම.
4. චිත්තං සංයමෙස්සන්ති - සංහිඳියාව ඇති කිරීම.
5. සම්මාපනිහිතං චිත්තං - මනාව යෙදීම.
6. නගරූපංමං චිත්තමිදං ඨපෙත්වා - නගරයක ක්‍රියාකාරීත්වයට සමානව සිතේ ක්‍රියාකාරීත්වය මනාව පිහිටුවීම, ආරක්ෂණ විධිවිධාන තහවුරු කිරීම.[4]


ධම්මපදාගත චිත්ත විග්‍රහය තුළ යහපතෙහි හා අයහපතෙහි සිත යෙදවීම පිළිබඳව ද කදිම විග්‍රහයක් සිදු වේ. ඒ අනුව 'යහපතෙහි යෙද වූ සිත නිසා මිනිසා කිසිවෙකුටත් තමා වෙත කළ නොහැකි තරම් අයහපතක් තමා වෙත ලඟා කර ගනී.' මෙහි අහිතකර ඵල විපාකය ලෝකයාට ම විඳින්නට සිදු වේ. මෙවැනි සිත් 02 ක් පිළිබඳව ධම්ම පදය විවරණය දක්වයි. එනම්,

1. අනවස්සුත චිත්ත (රාගයෙහි හා ද්වේශයෙහි ගැටුණු සිත)
2. අනවට්ඨිත චිත්ත (රාගයෙහි හා ද්වේශයෙහි නොගැටුණු සිත) යනුවෙනි.

මේ සිත් දෙක යහපත හා යහපත උදාකරන බව ප්‍රකාශ වේ. සිත දමනයට උත්සුක වීම පණ්ඩිත පුරුෂයාගේ ලක්ෂණයයි. කර්තෘ අර්ථයෙන් හා උපකරණ අර්ථයෙන් ද සිත පිළිබඳ විග්‍රහ කිහිපයක් ත්‍රිපිටකගත සාධක මගින් ප්‍රකට වේ. (රූපාදී ආරමමණං චිනෙතතීති චිත්තං) යනුවෙන් උපකරණ අර්ථය ද විවරණය වී තිබේ. අභිධර්ම ාර්ථ විග්‍රහයට අනුව (ආරම්මණං විජානන ලක්ඛණං චිත්තං) පසිඳුරන් මගින් අරමුණු දැන ගන්නා ස්වරූපය චිත්ත යනුවෙන් ද විග්‍රහ කරති. ජබ්බ්සෝදන සූත්‍රය විමුක්තිය පිළිබඳව දක්වන අවස්ථාවේදී 'මන' යන්න වෙනුවට 'චිත්ත' යන්න භාවිතා කරයි. මනස ආයතනයක් නිසා එවැනි තත්ත්වයකට පත්විය නොහැක. ලෝකය මෙහෙයවන ප්‍රධාන බලවේගයක් ලෙස මානසික ක්‍රියාකාරීත්වය දැක්වීමේදී ද භාවිත කර ඇත්තේ චිත්ත යන්නයි.

'චිත්තෙන නීයති ලොකො චිත්තේන පරිසක්කතී
චිත්තස්ස ඒකධම්මස්ස සබ්බේව වසමන්වගූ'[5]

සිතෙන් ලොව හසුරුවනු ලබන බවත්, අදිනු ලබන බවත්, ඒ නිසා සෑම තැනම සිත නම් වූ එනම් දහමට වසඟව සිටින බවත් ඉහත ගාථාවෙන් කියවේ. සසර ගමන පිළිබඳ කෙරෙන බෞද්ධ විවරණයෙහි 'චිත්ත' යන්න ප්‍රධාන අංශ 02 යටතේ සාකච්ඡාවට ලක්ව ඇත.






සත්වයාගේ මරණය සම්බන්ධ ක්‍රියාවලිය විග්‍රහ කරන්නක් වශයෙන් චුති සිත හඳුනාගත හැක. මෙම චුති චිත්තය පටිසන්ධි චිත්තය සඳහා අනුරූප වශයෙන් බලපා ඇත. පටිසන්ධි චිත්ත යනු උපන් භවයෙහි පළමු සිතුවිල්ලයි.

සිතෙහි ක්‍රියාකාරිත්වය පිළිබඳ කදිම උපමා උපමේය විවරණ යක් මහාතණ්හාසංඛය සූත්‍රයෙහි ඇත. විශේෂයෙන් මෙය චිත්ත ලක්ෂණ විවරණයකි.

'සෙය්‍යථාපි, භික්ඛවෙ මක්කටෙ අරඤ්ඤෙ පවනෙ
චරමානො සාඛං ගණ්හාති. තං මුඤ්චිත්වා අඤ්ඤං
ගණ්හාති. එවමෙව ඛො භික්ඛවෙ යදිදං වුච්චති
චිත්තං ඉතිපි ... උප්පජ්ජති ... අඤ්ඤං නිරුජ්ඣති'[6]

මහණෙනි යම් සේ වානරයෙක් වනයෙහි නිදැල්ලේ හැසිරෙන්නේ ගසක එක් අත්තක් අල්ලා ගන්නේ මුලින් ගත් අත්ත අත්හරි). එප රිද්දෙන් මේ සිත දිවා රාත්‍රී එක් අරමුණක් ගනී. අනෙක් ම අතහරී. ශ්‍රාවක භික්ෂූන් වහන්සේලා බුදුරදුන්ගෙන් සිත පිළිබඳ අසන ලද ප්‍රශ්නයකට දෙන ලද පිළිතුරක් අංගුත්තර නිකායෙහි සඳහන් වේ.

'නාහං භික්ඛවෙ අඤ්ඤං ඒක ධම්මං පි සමනුපස්සාමි. යං ඒවං ලහුපරිවතතං. යදිදං චිතතං, යාවඤ්චිදං භික්ඛවෙ උපමාපි සුකරා යාව ලහුපරිවත්තං චිත්තංති'[7]

වහා ඉපිද වහා නස්නා සුළු වේ නම් එයට උපමාවකදු අතිශය දුෂ්කර වන බවත් දේශනා කොට ඇත. අභිධර්මයට අනුව සිතෙහි චිත්තක්ෂණ 17 කි. එකී සිතුවිල්ලකදී මෙම අංශ 17 සිදුවීම විශේෂ ත්වයකි.

1. භවංග සිත - නිදියන සිත
2. භවංග ජලන - සිත සෙලවීම
3. භවංග උපච්ඡේද - භව තත්වය සිඳීම
4. පඤ්චද්වාරාවජ්ජන - පංච ඉන්ද්‍රියන් ආශ්‍රයෙන් ලැබුණු අර මුණු විමසීම.

5. පඤ්ච විඤ්ඤාණ - පංච ඉන්ද්‍රියන් ඇසුරු කළ සිත පහළ වීම.
6. සම්පටිච්ඡන - අරමුණු පිළිගැනීම.
7. සන්තීරණ - අරමුණු තීරණය කිරීම.
8. වොත්ථප්පන්න - අරමුණු විනිශ්චය කිරීම.
9. ජවන - (ජවන සිත් 7 කි) කුසල අකුසල වශයෙන් ප්‍රතිචාර දැක්වීම.
10. තදාලම්බන - අරමුණෙහි රස විඳීම වශයෙන් පහළවන සිත් (තදාලම්බන සිත් දෙකකි)
11. භවංග සිත - නැවත නිදියන සිත.

සිත අපිරිසිදු වන්නේ ගනු ලබන අරමුණු පදනම් කොට ගෙනය. පුද්ගල චිත්තනය තමාට මෙන්ම අනුන්ටද හිත පිණිස පැවැත් විය යුතුය. සිත ස්වභාවයෙන් ප්‍රභාස්වර වූව ද ආගන්තුක උපක්ලේශයන්ගෙන් කිලිටි වේ.

''පභස්සරමිදං බො භික්ඛවේ චිත්තං, චිත්තං තඤ්ච බො ආග න්තුකෙහි උපක්කිලෙසෙහි උපක්කිළිට්ඨන්ති" [8]

("මහණෙනි ඒ සිත පැහැ විහිදුවන්නේය. එය වනාහි ආගන්තුක වූ රාගාදී උපක්ලේශයන් විසින් කිලිටි කරණ ලද්දේය.")

කය විනාශ වන සුලු වූව ද ශ්‍රද්ධා, ශීල, ශ්‍රැත, ත්‍යාග යන ගුණධර්ම පුරුදු කළ සිත දීර්ඝ කාලයක් හිත සුව පිණිස පවතී. මෙමගින් සිත ද භවගාමීයැයි සැකයක් මතු වූවද මෙහිදී සංඛාර යන්න අදහස් කෙරේ. පුඤ්ඤපාප සංඛාර මතුවේ. සිතුවිලි පරම්පරා අදහස් කිරීම සඳහා ද චිත්ත යන්න භාවිත කොට ඇත.


'චේතයිත්වා කම්මං කරොති කායෙන වාචාය මනසා'[9]

(සිතින් කයින් වචනයෙන් මනසින් සිතා කර්ම කරයි.) සමථ විදර්ශනා භාවනා ක්‍රම මගින් සිත වැඩීම උභයාර්ථ සිද්ධිය හා නිර්වාණාවබෝධය පිණිස හේතු වේ.



'එකග වූ සිත පිරිසිදු වූ කල්හි, දීප්තිමත් වූ කල්හි, කිලිටි නැති වූ කල්හි, පහ වූ චිත්තෝපක්ලේෂ ඇති කල්හි විදර්ශනා ඥානය පිණිස අභිමුඛ කෙරේ.'[10]

සිත පිරිසිදු කිරීම භාවනාව මගින් සිදු කළ යුත්තකි. එනිසා චිත්ත යන්න පිරිසිදු කළ හැකි තත්වයක් ලෙස බුදු සමයේ විවරණය කරයි. පිරිසිදු කිරීමේ අර්ථයෙන් සිතෙහි කොටස් දෙකකි.




මහණෙනි, යම් සේ නොවඩන ලද සිත මහත් වූ අනර්ථය පිණිස පවතී ද එබඳු වූ අනික් එකම ස්වභාවයකුදු මම නොදකිමි. මහණෙනි, සිත නොවඩන ලද්දේ මහත් වූ අනර්ථය පිණිස පවතී."

''මහණෙනි, යම් සේ සිත දමනය කරන ලද්දේ මහත් අනර්ථය පිණිස පවති. එබඳු එකම ස්වභාවයකදු මම නොදකිමි. මහණෙනි සිත දමනය කරන ලද්දේ මහත් වූ අර්ථය පිණිස පවතී".[11] අසංවර වූ සිත මිනිසාගේ සතුරායි. සංවර වූ සිත මිනිසාට කල්‍යාණ මිත්‍රයෙකි. එනිසා සියලු බුදුවරු සිත දමනය කිරීම පිණිස අනුශාසනා කරති.

'සබ්බ පාපස්ස අකරණං කුසලස්ස උපදම්පදා
සචිත්තපරියොදපනං ඒතං බුද්ධානසාසනං'[12]

එනිසා බුදු සමයේ චිත්තානුපස්සනා භාවනාව නිර්දේශ කරමින් සිත යහපතෙහි යෙදවීමට මග පෙන්වයි. චිත්ත තුළ නාම ලෙසින් රැස් වී ඇති විවිධ මානසික ධර්ම විඤ්ඤාණය පුබුදුවමින් මනෝ ලෙස ක්‍රියාත්මක වේ. තෘෂ්ණාව ද මෙයට මුල්වන අතර එමගින් නැවත නැවතත් භවය හට ගනී. 'වියමනේ එක් කොනක සළායතනයය. විෂය අරමුණු වියමනේ අනිත් කොනේය. විඤ්ඤාණ

ස මැදය. මේ සියල්ල ඇසුරෙන් රෙද්ද වියන්නා තෘෂ්ණාවයි."[13] දියුණු කළ සිතින් අන් අයගේ සිතිවිලි පවා ග්‍රහණය කර ගත හැකි අතර සිත විමුක්තියට පත් වූ බව දැන ගන්නේ සිතින්ම ය.

## මනෝ

මනෝ යන්න සිතීමය. හැඟීම් යන අර්ථය ඇති 'මන්' ධාතුවෙන් නිපන් පදයකි. රීස් ඩේවිඩ් මහතාගේ අර්ථ ගැන්වීමට අනුව මනෝ යනු සිතේ-පෙළඹුනු ඥානමය අවස්ථාවයි. [14] මනස යන්න බුදු දහම තුළ ඉන්ද්‍රියක් ලෙසට විවරණය වී ඇති අතර - ධම්ම ඒ සඳහා අරමුණු වේ. මනස පිළිබඳ විවිධ මත පවති. පෙරදිග හා අපරදිග දර්ශනවාදී බොහෝමයක මෙම ගැටලුව අධ්‍යයනයකට හසුව ඇත. එම විවිධ මතවාද සමගින් බෞද්ධ මතය ගලපා ගනිමින් අධ්‍යයනය කළ යුතු වේ. පෙරදිග ප්‍රමුඛ දර්ශනයක් වූ උපනිශද්හි මනස ආත්මන් සමග සම්බන්ධ-වී ඇත. වින්දනය කරන දේ සහ ලබා ගන්නා දැනුම ආත්මන් වන බව උපනිශද් මතයයි. බෞද්ධ විවරණයට අනුව ඇසට රූප අරමුණු වන්නොසේ ම මනසට ධර්ම අරමුණු වේ. ඊට වඩා වැඩි යමක් නොමැත. එනිසා මනස පිළිබඳ බෞද්ධ විවරණය ඉන්ද්‍රියාර්ථයෙන්ම සිදු වූවක් බව මූලිකවම තේරුම් ගත යුත්තකි. මනෝ යනු කුමක්ද යන්න හඳුනාගැනීමට අදාළ කදිම විවරණයක් මහානිද්දේස පාළියේ එයි

'මනෝතියං චිත්තං මනෝ මානස හදය පණ්ඩරං මනෝ මනායතං මනින්ද්‍රියං විඤ්ඤාණක්ඛන්ධො තජ්ජා මනෝ විඤ්ඤාණධාතු අයං වුච්චති මනෝ'[15]

(මනෝ නම් වූ සිතෙක්, මනසෙක්, මානසයෙහි හෘදයෙක්, පණ්ඩර වූ භවාංග සිතෙක්, මනසෙක්, මන සංඛ්‍යාත ආයතනයෙක්, මිනින්ද්‍රයෙක්, විඥානයෙක්, විඥානක්ඛන්ධයෙක්, තදනුරූප වූ මනෝ විඥානධාතුවක් වේ ද මෙය 'මන' යැයි කියනු ලැබේ)

බුදු සමයේ සියලු ඉගැන්වීම් මනස ප්‍රධාන කර ගනිමින් ව්‍යාප්තව ඇත. එයට සමානාර්ථ පද ලෙස චිත්ත, විඤ්ඤාණ ආදි පද යොදා ඇත. ඒවාට ආවේනික වූ අර්ථ හා අවස්ථා විද්‍යාමාන වන බව බුදුසමයෙහි සංකීර්ණ මනෝ විග්‍රහය පෙන්වා දේ. නමුත් මනසේ



සියලු ක්‍රියාකාරීත්වයන් අර්ථවත් වන පොදු නාමයක් ලෙස ද 'මනෝ' යන්න හඳුන්වාදිය හැකිය. නමුත් චිත්ත, විඤ්ඤාණ යන අවස්ථාවන්ට වඩා 'මනෝ' යන්න බුදු සමය තුළ ඉන්ද්‍රිය සමඟ බද්ධව ඇති බව අප ඉහතින් ද සදහන් කළෙමු.

'ඡයිමානි භක්ඛවෙ ඉන්ද්‍රියානි කතමානි චක්ඛුඉන්ද්‍රියං ... මනින්ද්‍රියං...'[16] පුද්ගලයා පිළිබඳ බුදු දහමේ විවරණයට අනුව එය නාමරූප සමවායකි. මෙහි නාම ගණයට මනෝ යන්න අයත් වේ.

පංච ඉන්ද්‍රියන් අතුරෙන් චක්ඛු ආදී ඉන්ද්‍රියන් බාහිර ඉන්ද්‍රියන් ලෙස ද මනස අභ්‍යන්තර ඉන්ද්‍රියක් ලෙසද හඳුනාගැනීම වඩාත් නිවැරදිය. 'මනෝ' යන්න ආයතනාර්ථයෙන් විග්‍රහ වන අවස්ථාවක් අංගුත්තර නිකායේ අන්තර්ගත වේ.

'යේකේචි භික්ඛවෙ ධම්මා අකුසලභාගියා අකුසල පක්ඛිකා සබ්බේ තෙ මනෝ පුබ්බංගමා මනෝ තේසං ධම්මානං පඨමං උප්පජ්ජති. නේවදේව අකුසලා ධම්මාති'[17]

("මහණෙනි, යම් කිසි අකුසල හෝ කුසල කොටසකට අයත්, අකුසල පක්ෂයට අයත් යම් කිසි ධර්ම කොටසක් වේද ඒ සියල්ල මනස පෙරටුකොට ඇත. මනෝ යන්න ධර්මවලට-ප්‍රථමව උපදී...") එම ආයතනයට ධර්ම අරමුණු වන අතර එය අභ්‍යන්තරව පවතින තත්වයකි. එය ඉන්ද්‍රියන් අතර ප්‍රමුඛව පවතින අතර ඉන්ද්‍රියන් අතර එය අභ්‍යන්තරව පවතින තත්වයකි. ඉන්ද්‍රියන්ගේ පැවැත්මට ද බල පානු ලබයි. මනස පිළිබඳ පෙරටු ඉගැන්වීමක් ධම්මපදයේ පළමු ගාථාද්වයෙන් විවරණය කෙරේ.

'මනෝ පුබ්බංගමා ධම්මා මනෝ සෙට්ඨා මනෝමයා
මනසා චෙ පදුට්ඨේන භාසති වා කරෝති වා
තතෝනං දුක්ඛමන්වෙති චක්කං ව වහතෝ පදං'

'මනෝ පුබ්බංගමා ධම්මා මනෝ සෙට්ඨා මනෝමයා
මනසා චෙ පසන්නේන භාසති වා කරොති වා
තතෝනං සුඛමන්වෙති ඡායාව අනපායිනී' [18]

උක්ත ගථා විවරණයට අනුව මනස ක්‍රියාත්මකව තිබුණේ නම් පමණක් එම ක්‍රියාව කර්මයක් බවට පත්වේ. සිතුවිල්ල නරක වූවහොත් ක්‍රියාව ද නරක වන අතර සිතුවිල්ල හොඳ වූවහොත් ක්‍රියාව ද යහපත් වේ. ඒ අනුව මනස මූලිකව සිදුවන කර්මවලට පමණක් පුද්ගලයා වගකිව යුතුය. බුදු දහම තුළ මනෝ විද්‍යාත්මක ක්‍රමවේදයක් ඇතැයි පවසන්නේ ඉහත ඉගැන්වීම් මනස මූලිකව සිදුකර ඇති බැවිණි. එසේම ලෝක ආගම් හා දර්ශන ඉතිහාසයේ මනස පිළිබඳ ගැඹුරු ම හා ප්‍රබල ම අධ්‍යයනය හා විශ්ලේෂණය ද බුදු දහම සතු වේ. උපනිෂද් චින්තනය තුළ මනස සංකල්පය ආත්මන් හරහා බ්‍රහ්මන් බවට විකාශනය වූ අතර බ්‍රාහ්මන් විශ්ව පාලකයා විය. ශ්‍රමණ සම්ප්‍රදායේ නව මඟක් විවර කළ බුදුරදුන් මන සංකල්පය හරහා විශ්වීය විවරණයක් ඉදිරිපත් කළහ. පෙරදිග විශිෂ්ටතම චින්තකයා වු බුදුරජාණන්ගේ මනස පිළිබඳ විවරණය නූතනයේ වූව ද පරිපූර්ණ වශයෙන් ගෝචර නොවූවකි. පාලි ව්‍යාකරණ වීමංසාවන්ට අනුව මනස සිදු කරන්නේ මඤ්ඤති 'හඟයි' යන ක්‍රියාවයි. (මන + ය + ති > මඤ්ඤති/මනයති) මහා නිදාන සූත්‍රයට අනුව මනස නාමරූප, විඤ්ඤාණ සමඟින් එකිනෙකට ප්‍රත්‍යව පවතී.[19] පොට්ඨපාද සූත්‍රයේ පෙන්වාදෙන ආකාරයට ආත්මභාව ස්වරූපයන් 03 කි.

1. ඕලාරික ආත්ම පටිලාභය
2. රූපී මනෝමය ආත්ම පටිලාභය
3. අරූපී සංඥාමය ආත්ම පටිලාභය. යනුවෙනි.

මනෝමය ආත්මලාභය පිළිබඳ ද [20] විවරණය කරන බුදු දහම සියල්ල අඟ පසඟ මනසින් නිර්මිත වු මානසික ස්වරූපයක් ඇති අය පවා සඳහන් කරති. ධ්‍යාන බලයෙන් පහළ වන මොවුන් පිළිබඳ නවීන ලෝකය තාරකාමය ශරීර (Astrallbody) ඇත්තවුවන් සේ හඳුන්වති. මෙය මනසින් ගෝචර කළ යුතු පියවි ඇසට නොපෙනෙන තත්වයක් ලෙස නිරීක්ෂකයන් පැහැදිලි කරන අතර බුදු දහම ද මෙබඳු තත්ව පිළිබඳ විවරණය කරයි. 'සිත මිස කය නැති බඹලොව යතරකි'[21] යනුවෙන් බෞද්ධ සාහිත්‍ය ග්‍රන්ථවල ඒවා පිළිබඳ විවරණය වේ.



කෙසේ වෙතත් මෙහිදී අපගේ විශේෂ අවධානය යොමු වන්නේ එවැනි අධිභෞතික සංකල්ප පිළිබඳ ගැඹුරු විවරණයකට නොව. 'මනෝ' යන්න අටුවාවන්හි බහුල වශයෙන් විවරණය වී ඇත්තේ ඉන්ද්‍රියාර්ථයෙන් නොවේ. 'මනංති භවං චිත්තං'(මනස භවං සිත) යනුවෙන් හඳුන්වා ඇත. ඇලූෂියස් පීරිස් පියතුමා මේ පිළිබඳ කරන විවරණයේදී සඳහන් කරන්නේ 'මනෝ' යන්න බාහිර අරමුණක දැන ගැනීමේ භවාංග මනසේ සිදුවන ක්‍රියාකාරී අවදිකම (Noetic Awakening) යනුවෙනි. අභිධර්ම විවරණයට අනුව 'බාහිර ලෝකයාට මානසික ක්‍රියාවලිය විවෘත වන ද්වාර අවස්ථාවක් ලෙසත්, අරමුණු පිළිගන්නා ද්වාරික අවස්ථාවක් ලෙසත්[22] හැඳින්විය හැකිය. මේ අනුව මරණාසන්න චිත්තය අවස්ථාවක් ලෙසත්, අරමුණු පිළිගන්නා ද්වාර අවස්ථාවක් ලෙසත්, ඉන්ද්‍රියාර්ථයක් ලෙසත් විස්තර වේ. මහාචාර්ය හේමචන්ද්‍ර මහතාගේ විවරණයකට අනුව මන යන්න යාන්ත්‍රික ක්‍රියාවලියක් ගෙන දේ.'[23] මනස ඉන්ද්‍රියාර්ථයෙන් විවරණය කර ඇති ආකාරයට කදිම නිදසුනක් ධම්ම සංගණී ප්‍රකරණයෙහි ඇතුළත් වේ. 'මනින්ද්‍රියං හොති' [24]

ඒ අනුව ධම්මසංගනිය මනෝ යන්න විග්‍රහ කොට ඇත්තේ ද චිත්ත යන්න විග්‍රහ කොට ඇති ආකාරයට සමාන ආකාරයෙනි. චක්ඛු ආදී ඉන්ද්‍රියන්ට ඊට අදාළ අරමුණු පමණක් ගෝචර වේ. කණට ශබ්ද ආදීය ගෝචර වූව ද රූප අරමුණු නොවේ. නමුත් මන ඉන්ද්‍රියට අනෙකුත් ඉන්ද්‍රිය අරමුණු කෙරෙහි ද ව්‍යාප්ත විය හැකිය.

ඒ අනුව මන ඉන්ද්‍රිය අනෙකුත් ඉන්ද්‍රියන්ගෙන් ලබන අරමුණුවල අභ්‍යන්තර සම්බන්ධීකාරකයා වශයෙන් කටයුතු කරයි. ඉන්ද්‍රියාර්ථයට අමතරව මනෝ ආයතනාර්ථයෙන් විග්‍රහ කොට ඇති බව අප ඉහතින් ද සඳහන් කළ අතර ධම්මසංගණිය ඒ පිළිබඳ පැහැදිලි විවරණයක් ඉදිරිපත් කරයි.

උක්ත ස්වරූපයන්ට අනුව 'මනෝ' යන්න බුදුදහම තුළ ඉන්ද්‍රියාර්ථයෙන්ද, ආයතනාර්ථයෙන් ද සියලු ධර්ම පෙරටු කරගත් ස්ථානයක් වශයෙන් ද සියලු ධර්මවලට පෙරටුව උපදින්නක් ලෙස ද

භාවිත වී තිබේ. 'මනෝ'අර්ථකථනය වඩාත් හොඳින් වටහා ගැනීම සඳහා චිත්ත, විඤ්ඤාණ විවරණයන් ද උපකාරි වේ. මනෝ යන්න පිළිබඳ තවත් අර්ථකථන රාශියක් ත්‍රිපිටකය පුරාවට විසිරි තිබුණ ද මෙහිදී අපගේ අවධානය යොමු වූයේ ඉන් කිහිපයක් පමණි.

## විඤ්ඤාණ

විඤ්ඤාණය යනු දැනීමයි (සංජානනය Perception ප්‍රජානනය Cogonition - විඤ්ඤාණං අනිදස්සනං)[25] විඤ්ඤාණය තරම් වේගයෙන් වෙනස්වන යමක් නොමැති අතර එය උපමාවකිනිදු දැක්වීමට අපහසුය. බුදු දහම තුළ බහුල වශයෙන් විවරණය වූ ද, විවරණ ගැටලු මතු වු ද කොටසකි මෙය. පශ්චාත් බෞද්ධ සම්ප්‍රදායන්හි ද වෙනම දර්ශන බිහිවීමට තරම් විඤ්ඤාණය ප්‍රබල විය. ඉන්ද්‍රිය හා අරමුණු ගැටීමෙන් විඤ්ඤාණය ප්‍රභවය වේ.

'චක්ඛුං පටිච්ච රූපේච උප්පජ්ජති චක්ඛු විඤ්ඤාණං'[26]

(ඇස හා රූපය ගැටීමෙන් චක්ඛු විඤ්ඤාණය හටගනී)

මේ ආකාරයට ඉන්ද්‍රිය 06 ට අදාළ විඤ්ඤාණය උපදින අතර මනස මූලික වීමෙන් මනෝ විඤ්ඤාණය හට ගනී.

'මනඤ්ච පටිච්ච ධම්මේච උප්පජ්ජති මනෝ විඤ්ඤාණං'[27]

(මනස හා ධර්ම ගැටීමෙන් මනෝ විඤ්ඤාණය උපදී)

සෙසු ඉන්ද්‍රියයන් මෙන් මනස ද ධර්ම දකින බව සංයුක්ත නිකාය තවදුරටත් පැහැදිලි කරයි.

'පූන ච පරං උපවාන භික්ඛු මනසා විඤ්ඤාය


ධම්මං පටිසංවේදි හෝති ධම්මරාගපටිසංවේදීච'[28]

ඒ අනුව ඉන්ද්‍රියන් 06 ට ගොදුරුවන අරමුණු 06 මගින් විඤ්ඤාණය උපදී.



1. චක්ඛු ⟶ රූප ⟶ චක්ඛු විඤ්ඤාණය
2. සොත ⟶ ශබ්ද ⟶ සොත විඤ්ඤාණය
3. ඝාන ⟶ ගන්ධය ⟶ ඝාන විඤ්ඤාණය
4. ජිව්හා ⟶ රස ⟶ ජිව්හා විඤ්ඤාණය
5. කාය ⟶ ස්පර්ශ ⟶ කාය විඤ්ඤානය
6. මන ⟶ ධර්ම ⟶ මනෝ විඤ්ඤාණය

පොදුවේ පුද්ගලයා ස්කන්ධ පහකට බෙදා වෙන් කරන අතර පුද්ගලයාගේ මූලික සවිඤ්ඤාණිකත්වය, ප්‍රාණත්වය, විඤ්ඤාණස්කන්ධය මගින් විස්තර වේ. එසේම වේදනා, සඤ්ඤා, සංඛාර යන ස්කන්ධ තුනට ද මින් තොරව පැවතිය නොහැක.




නාම රූප වේදනාස්කන්ධය, සඤ්ඤාස්කන්ධය, සංඛාරස්කන්ධය, විඤ්ඤාණස්කන්ධය

විජානාති බො විඤ්ඤාණං' යනුවෙන් පැහැදිලි කළ ආකාරයට මේ සියල්ල තුළින් අපේක්ෂා කරන්නේ සංජානනයයි.[29] දැන ගැනීමටයි. විඤ්ඤාණය පිරිසිදු කළ යුතු හෝ දියුණු කළ යුතු අංගයක් ලෙස සූත්‍ර සාහිත්‍යය තුළ අවධාරණය නොවේ. එම අංශය චිත්ත /මන සංකල්පවලට අදාළ වේ. විඤ්ඤාණය පරිජානනය කළ යුතු වේ. 'විඤ්ඤාණං පරිඤ්ඤෙය්‍යං'[30] ඒ අනුව එය හාත්පසින් අධ්‍යයනය කළ යුත්තකි. දැනගත යුත්තකි.

පුනර්භව ක්‍රියාවලියේදී භවයන් අතර සම්බන්ධීකාරකයා වන්නේ ද විඤ්ඤාණයයි. විඤ්ඤාණය මව් කුසට බැස නොගන්නේ



ශ්‍රී ලංකා භික්ෂු විශ්වවිද්‍යාලය
16 JUL 2015

නම් එහි නාම රූප නොවැඩේ. සෑම විට ම විඤ්ඤාණය අනාගත යේ පුනර්භව උපතකට හේතු වේ.

'විඤ්ඤාණාහාරො ආයතිං පුනභාවාභිනිබ්බත්තියා පච්චයෝ'[31]

එසේම විමුක්ත පුද්ගලයාගේ විඤ්ඤාණය නැවත ප්‍රතිසන්ධි යක් නොලබන නිසා පුනර්භවය පත් නොවේ. එය පරිනිර්වාණයයි. ඒ අනුව නිර්වාණාවබෝධය යනු නැවත විඤ්ඤාණයේ හට නොගැනීම ලෙස ද විවරණය කළ හැකිය. පුනර්භවය හා බැඳුණු විඤ්ඤාණය පිළිබඳ ඉගැන්වීම් කිසිවිටෙක බුදු සමය ආත්මවාදයකට බැර නොකරයි. නමුත් එම ඉගැන්වීම් හේතුවෙන් ම බුදු දහම ආත්මවාදී විවරණයන්ට බුද්ධකාලයේදී ම ලක් වූ බව ද පැහැදිලි වේ. විඤ්ඤාණය පිළිබඳ වැරදි අර්ථකථනයක් ලබා ගත් කේවට්ටපුත්ත සාති භික්ෂුව වෛදික චින්තනයේ ආත්මන් සම්බන්ධයෙන් පිළිගෙන තිබුණු ලක්ෂණ 02 ක් විඤ්ඤාණය සම්බන්ධයෙන් පිළිගෙන තිබුණි.

1. ක්‍රියාව පිටුපස කරන්නෙක් සිටියි.
2. එයට සදාකාලික පැවැත්මක් ඇත.[32]

සාති භික්ෂුවගෙන් එම කරුණු බුදුරදුන් විමසූ විට උන් වහන්සේ ප්‍රකාශ කරන ලද්දේ ඔබ වහන්සේ දේශනා කරන ආකාර යට දිවෙන එකම විඤ්ඤාණයක් ඇති බවයි. නමුත් බුදුරදුන් මෙහිදී පැහැදිලි කරන ලද්දේ,

> 'හිස් මිනිස, විඤ්ඤාණය හේතු ප්‍රත්‍යයන්ගෙන් හට ගන්නා බවත්, හේතු ප්‍රත්‍ය නොමැතිව විනාශ වන බවත් මා නොයෙක් ආකාරයෙන් වදාරන ලද්දේ නොවේද?'[33] යනුවෙනි.

මෙය තවදුරටත් පැහැදිලි කරන මහාතණ්හා සංඛය සූත්‍රය කිසියම් ප්‍රත්‍යයක් නිසා ගින්න දිලේ ද, එම නමින් ගින්න හඳුන්වයි. ඒ අනුව දර නිසා ඇති වන ගින්න 'දර ගින්න' යනුවෙන් ද, කසළ නිසා ඇතිවන ගින්න 'කසල ගින්න' වශයෙන් ද හඳුන්වන්නා සේ විඤ්ඤාණය ද එකිනෙක ප්‍රත්‍යන්ට අනුව වෙනස් වන බව පවසයි. ඉන්ද්‍රිය විඤ්ඤාණයන්හි පහළ වීමට, අරමුණු හා ඉන්ද්‍රිය පමණක්



ප්‍රමාණවත් නොවන බව ද බුදුදහම අවධාරණය කරයි. චක්ඛු විඤ්ඤාණය පහළ වීමට අවශ්‍යය කරුණු රාශියකි.

1. ඇස තිබීම.
2. ඇස හොඳින් පෙනීම.
3. ආලෝකය හොඳින් පෙනීම.
4. මානසික අවධානය.

ආදිය එහිදී අවශ්‍ය වන අතර අනෙකුත් විඤ්ඤාණ පහළවීම සඳහා ද මෙවැනි කරුණු සම්පූර්ණ විය යුතුය. සංයුක්ත නිකායේ අස්සුතවත්‍ථ සූත්‍රයට අනුව අත්තක් අල්ලාගෙන අත්තක් අත හරිනා සේ විඤ්ඤාණය ද විවිධ හේතු ප්‍රත්‍ය මගින් වෙනස් වේ. වහා උපදී, ප්‍රතීත්‍ය සමුප්පන්න වූ විඤ්ඤාණයෙහි ලක්ෂණ දෙකක් දැකිය හැක.

1. විජානන (දැන ගැනීමේ) ක්‍රියාව
2. පුද්ගල පෞරුෂය අඛණ්ඩව පවත්වාගෙන යාම.

මෙහි දෙවන කාර්යයට අනුව භවය පවත්වාගත හැක්කේ භෞතික ශරීරයටත්, අභෞතික ශරීරයටත්, අභෞතික විඤ්ඤාණයටත් පමණි. විඤ්ඤාණය මව්කුසට නොපැමිණිය හොත් සත්වයාගේ නාම රූප පහළවීම සිදු නොවේ. මව්කුස දරුවකු පිළිසිඳ ගැනීමට අදාළ කරුණු 03 ක් බුදු දහම පෙන්වා දෙයි

1. මව හා පියාගේ එකතු වීම.
2. මව ඍතුනීව සිටීම.
3. ගන්ධබ්බයාගේ පැමිණීම.[34]

මෙහි තුන්වන කාරණය 'පටිසන්ධි විඤ්ඤාණය' යනුවෙන් ථෙරවාද විග්‍රයෙහි එයි. මෙලොව පරලොව අතර සම්බන්ධය ඇති කරනු ලබන විඤ්ඤාණය අබ්භොච්චින්න විඤ්ඤාණ ලෙස සම්පසාදිය සූත්‍රය විස්තර කරයි.

පුද්ගලයාගේ සසර ගමන පිළිබඳ විග්‍රහ කරන පටිච්ච සමුප්පාදය තුළ විඤ්ඤාණය පිළිබඳ මූලික ඉගැන්වීමක් අන්තර්ගත වේ. සංඛාර පච්චයා විඤ්ඤාණං විඤ්ඤාණ පච්චයා නාමරූපං'[35]

එනිසා සත්වයාගේ නැවත පහළ වීම සඳහා ප්‍රධාන හේතු කාරකයකි විඤ්ඤාණය. මජ්ඣිම නිකායේ දැක්වෙන ආකාරයට පුද්ගලයා යනු සය ආකාරයකි. ධාතුවල සමවායකි. එහි විඤ්ඤාණය ධාතු අර්ථයෙන් විස්තර වේ.

'ඡද්ධාතුරෝ අයං භික්ෂු, පුරිසෝති ඉති වා පනෙතං වුත්තං. කිඤ්චේතං පටිච්ච වුත්තං. පඨවි ධාතු, අපෝ ධාතු, තේජෝ ධාතු, වායෝ ධාතු, විඤ්ඤාණ ධාතු'[36]

ඒ අනුව සත්වයා යනු ධාතු 06 ක එකතුවකි. මින් භෞතික වුද විවරණයක් ප්‍රකට කෙරේ. ලොව සියලුම දේ හේතු ප්‍රත්‍ය සමවායෙන් හටගනී. එවැනි ධාතු 04 කි.

1. පඨවි ධාතු
2. අපෝ ධාතු
3. වායෝ ධාතු
4. තෙජෝ ධාතු යනුවෙනි.

සත්වයාට පමණක් විඤ්ඤාණ ධාතුව ප්‍රධාන වන අතර ආකාස ධාතුව ද සුදුසු පරිදි ඒ ඒ තන්හි හේතු වේ. මෙසේ ෂඩ් ධාතු සමවායෙන් නාමරූප හට ගනී. නාම රූප විග්‍රහයේදී විඤ්ඤාණයේ ක්‍රියාකාරිත්වය බට මිටියකට උපමා කර තිබේ.

"බට මිටි දෙකක් එකිනෙක සම්බන්ධයෙන් සිටින්නේ සේ විඤ්ඤාණය හා නාමරූප එකිනෙකට සම්බන්ධව පවතී. ශරීරයෙන් විඤ්ඤාණය ඉවත් වූ විට සත්වයා මරණයට පත්වේ. එනිසා විඤ්ඤාණයෙන් තොරව භෞතික ශරීරයෙහි පැවැත්මක් හෝ ශරීර යෙන් තොරව විඤ්ඤාණයයෙහි පැවැත්මක් පිළිබඳ විමසීම අපහසුය. මෙම අංශ දෙක වෙන් වූ විට සත්වයාගේ මරණය සිදුවේ."[37] 'ධම්මපදයෙහි ඒ බව මෙසේ විවරණය වේ.

'අචිරං වතයං කායො පඨවිං අධිසෙසසති
ඡුද්ධෝ අපේත විඤ්ඤාණො නිරත්ථංව කලිංගරං'[38]



ශරීරයෙන් විඤ්ඤාණය ඉවත් වූ කල්හි එය දිරාගිය දරකඩක් මෙන් නිරර්ථකව පොළොව මත පතිත වන බව මින් පැහැදිලි වේ. උපන් ආයුෂ, කර්මජ ධාතුව හා විඤ්ඤාණය ශරීරයෙන් ඉවත් වූ විට සත්වයාගේ මරණය සිදුවන බව සංයුක්ත නිකාය විවරණය කරයි.

'ආයු ස්මාච විඤ්ඤාණං - යදා කායං ජහන්තිමං
අපවිද්ධෝ තදාසෙති - පරභතතං අචෙතනං'[39]

විඤ්ඤාණය පිළිබඳ ආත්මවාදී ස්ථාවර වූ ඉගැන්වීමක් සිදු නොකරන බුදුදහම එය ද අනිත්‍ය, දුක්ඛ, අනාත්ම ධර්මතාවන්ට අයත් කොට තිබේ.

රූපං භික්ඛවේ අනිච්චං.... විඤ්ඤාණං අනිච්චං
රූපං භික්ඛවේ දුක්ඛං... විඤ්ඤාණං දුක්ඛං
රූප භික්ඛවේ අනත්තා... විඤ්ඤාණං අනත්තා[40]

කෙසේ වෙතත් පොදුවේ ගත්කල විඤ්ඤාණය යන වචනය සඳහන් ප්‍රධාන අවස්ථා 04 ක් සූත්‍ර සාහිත්‍යය තුළ දැකිය හැක.

1. පංචස්කන්ධ සංකල්පය තුළ,
2. අටලොස් ධාතු විග්‍රහය තුළ
3.- බෞද්ධ හේතුඵලවාදය තුළ,
4. ප්‍රතිසන්ධි ක්‍රියාවලිය තුළ,

වශයෙනි. මේ අතුරින් බෞද්ධ මනෝ විග්‍රහය තුළ විඤ්ඤාණ සංකල්පය ද ඉතා සංකකීර්ණ අයුරින් විස්තර වී තිබේ. උක්ත කාරණාවන්ට අනුව මනස පිළිබඳ බෞද්ධ විග්‍රහය වඩාත් විද්‍යාත්මකවූත්, සංකීර්ණවූත් විග්‍රහයක් බව පැහැදිලි වේ.

## ආන්තික සටහන්

[1] The Bible - The British and Foregn Bible Socety 'Printed tn great Britain 1967, p,104

[2] **සංයුක්ත නිකාය**, නිද්‍රානවග්ග, අභිසමය සංයුක්ත, අස්සුතවන්තු සූත්‍රය, බු.ජ.මු. පිටුව 148.

[3] **ඛුද්ධක නිකාය**, ධම්ම පදය, චිත්ත වග්ගය, බු.ජ.මු. පිටුව 34.

[4] **ඛුද්ධක නිකාය**, ධම්ම පදය, චිත්ත වග්ගය, බු.ජ.මු. පිටුව 34.

[5] **සංයුක්ත නිකාය**, ධම්ම පදය, චිත්ත වග්ගය, බු.ජ.මු. පිටුව 72.

[6] **මජ්ඣිම නිකාය 1**, මහා යමකවග්ගය, මහාතණ්හා සංඛය සූත්‍රය, මු.ජ.මු. පිටුව 606.

[7] **අංගුත්තර නිකාය**, අනවවග්ගය, චිත්ත වග්ගය, බු.ජ.මු. පිටුව 72.

[8] **අංගුත්තර නිකාය**, ඒකක නිපාතය, පනිහිත අච්ච වග්ග, බු.ජ.මු. පිටුව 68.

[9] **මජ්ඣිම නිකාය,** චූල්ලකම්ම විභංග සූත්‍රය, බු.ජ.මු. පිටුව 39.

[10] **දීඝනිකාය,** කේවට්ඨ සූත්‍රය, බු.ජ.මු. පිටුව 520.

[11] **අංගුත්තර නිකාය 1,** අකම්මතිය වග්ගය 3, මහාතත්ථ සූත්‍රය, බු.ජ.මු. පිටුව 106.

[12] **දීඝනිකාය,** මහාපරිනිබ්බාන සූත්‍රය, බු.ඩ.මු, පිටුව 75.

[13] **අංගුත්තර නිකාය** 1, දන්තවග්ගය 3, දන්තචිත්ත සූත්‍රය, බු.ජ.මු පිටුව 107.

[14] Plli-English Dictoiry P.520.

[15] **මහානිද්දේසය පාලි**, බු.ජ.මු, පිටු 4-5.

[16] **සංයුක්ත නිකාය**, සුද්ධක සූත්‍රය, බු.ජ.මු, පිටුව 366.

[17] **අංගුත්තර නිකාය,** ඒකක කිපාත පාලි, අච්චරාසගාත වග්ග, පිටුව 98.

[18] **ඛුද්දක නිකාය**, ධම්මපද පාලි, යමක වග්ග, පිටුව 98.

[19] **දීඝනිකාය,** මහා නිධාන සූත්‍රය, බු.ජ.මු පිටුව 20.

[20] **දීඝනිකාය,** මහා නිධාන සූත්‍රය, බු.ජ.මු. පිටුව 20.

[21] **ලෝවැඩ සඟරාව**, මෛත්‍රී හිමි විද්‍යාගම, 1998, පිටුව 20.

[22] Rahula Walpola, **Buddhist Studies in honor**, P.214.

[23] Wejesekara, O.H, **The Buddhist Conecept of Mindu**, P.L.

[24] **අභිධර්ම පිටකය**, ධම්මසංගණීය, බු.ජ.මු. පිටුව 30.



[25] **මජ්ඣිම නිකාය 1,** මහා යමක වග්ගය, මහාතණ්හා සංඛය සූත්‍රය, බු.ජ.මු. පිටුව 606.

[26] **මජ්ඣිම නිකාය 1,** සීහනාද වග්ග, මධුපිණ්ඩික සූත්‍රය, බු.ජ.මු. පිටුව 280.

[27] **සංයුක්ත නිකාය 11**, සලායතන වග්ගය උපවාන සූත්‍රය, සූත්‍රය, බු.ජ.මු. පිටුව 112.

[28] **සංයුක්ත නිකාය 11,** සලායතන වග්ගය උපවාන සූත්‍රය, සූත්‍රය, බු.ජ.මු. පිටුව 94.

[29] **මජ්ඣිම නිකාය,** මහා යමක වග්ගය, මහාතණ්හා සංඛය සූත්‍රය,බු.ජ.මු. පිටුව 607.

[30] **මජ්ඣිම නිකාය,** මහා යමක වග්ගය, මහාතණ්හා සංඛය සූත්‍රය,බු.ජ.මු. පිටුව 607.

[31] **දීඝනිකාය 11,** මහා නිධාන සූත්‍රය, බු.ජ.මු. පිටුව 92.

[32] kalupahana. D.J. **Buddhist psychology**. P.04.

[33] **මජ්ඣිම නිකාය 1**, මහාතණ්හා සංඛය සූත්‍රය බු.ජ.මු, පිටුව 606.

[34] **මජ්ඣිම නිකාය 1,** මහා යමක වග්ගය, මහා තන්හා සංඛ්‍යා සූත්‍රය, බු.ජ.මු. පිටුව 622.

[35] **මජ්ඣිම නිකාය 1,** මහා යමක වග්ගය, මහා තන්හා සංඛ්‍යා සූත්‍රය, බු.ජ.මු. පිටුව 617.

[36] **මජ්ඣිමනිකාය 111**, චතුධාතු සූත්‍රය, බු.ජ.මු. පිටුව 31.

[37] **සංයුක්ත නිකාය 11**, අභිසමය සංයුක්තය, නළකලාපය සූත්‍රය.

[38] **ඛුද්ධක නිකාය**, ධම්ම පදය, චිත්ත වග්ගය, බු.ජ.මු. පිටුව 34.

[39] **සංයුක්ත නිකාය,** ඛන්ධ සංයුක්තය, ඵේණපිණ්ඩූපම සූත්‍රය, බු.ජ.මු. පිටුව 247.

[40] **සංයුක්ත නිකාය**, අනන්ත සූත්‍රය, බු.ජ.මු, පිටුව 38.